17

ෆික්හ් කලාව

"مَنْ يُرِدِ اللَّهُ بِهِ خَيْرًا يُفَقِّهْهُ فِي الدِّينِ". (رواه البخاري ومسلم)

" කවරකුට අල්ලාහ් යහපත පතා ඇත් ද, අල්ලාහ් ධර්ම අවබෝධය ලබා දෙනුයේ ඔහුට ය." (බුහාරි මුස්ලිම්)

ඉස්ලාමීය ඉතිහාසයේ විවිධ විද්‍යාත්මක කලාවන් බිහි විය. ඒවායින් ෆික්හ් කලාව ප්‍රමුඛ ය. ඉස්ලාමීය කලා අතුරින් මෙය ප්‍රථමයෙන් බිහි වූ කලාව ද වෙයි.

"ෆික්හ්" යන වචනයේ අර්ථය, "පැහැදිලි කිරීම" යන්න ය. ෂරීඅත්හි අල්කුර් ආන්, සුන්නා, ඉජ්තිහාද් ආදිය පදනමින් ලබාගත් නීති ෆික්හ් අන්තර්ගත ය.

"ෆික්හ්" තනි කලාවක් ලෙස තාබිඊන්වරුන්ගේ කාලයේ දියුණුවීමට පටන් ගත්තේ ය. මොවුන්ගේ කාලයේ ඉස්ලාමීය රටවල ප්‍රධාන නගරවල සුප්‍රසිද්ධ මුජ්තහිද් ෆික්හ් (පැහැදිලි කිරීමේ) පන්ති පැවැත්විණි. නව ප්‍රශ්න ඇති වූ විට ඔවුහු තම ඉජ්තිහාද්හි පදනමින් තීන්දු ලබා දුන්හ.

තබඋත් තාබිඊන්වරුන්ගේ කාලය, ෆික්හ් කලාවේ ස්වර්ණමය යුගය ලෙස සළකනු ලබන්නේ ය. විවිධ අලුත් ප්‍රශ්නවලට ආගමික විසඳුම් ලබාදීම අවශ්‍ය විය. එනිසා විද්වත්තු ඉජ්තිහාද්හි පදනමින් තීන්දු ලබා දුන්හ. පසුව මෙම තීන්දු ගොනු කොට ෆික්හි නීති පද්ධති ලෙස ප්‍රකාශ විය. ඒවා මද්හබ් බිහිවීමට හේතු කාරක විය.

ඉතිහාසයේ මද්හබ් රැසක් ම ඇති වුව ද විවිධ හේතු නිසා ඒවායින් ස්ථාවර ව පැවතියේ මද්හබ් හතරකි. ඒවා එම මද්හබ් බිහි කළ ඉමාම්වරුන්ගේ නමින් පැවැතිණි. මෙම ඉමාම්වරුන්ගේ වෑයම නිසා මුකල්ලිද් වූ ජනතාව ඉස්ලාමීය පදනමින් ජීවත්වීම පහසු කෙරුණි.

ඉමාම් අබූ හනීෆා රහිමහුල්ලාහ් (හිජ්රි 80-150)

නුහ්මාන් ඉබ්නු සාබිත් යන ස්වාභාවික නමින් යුත් ඉමාම් අබූ හනීෆා රහිමහුල්ලාහ් කූෆාහි උපත ලද්දේ ය. මෙතුමාණෝ "ඉමාමුල් අහ්ලම්" යැයි සුවිශේෂ නමින් ද හඳුන්වනු ලබති.

ඉමාම් අබූ හනීෆා රහිමහුල්ලාහ් ව්‍යාපාරිකයකු වූව ද, ආගමික කලාවන් ඉගෙනීමට උනන්දුවක් දැක්වූහ. කූෆාහි විසූ සුප්‍රසිද්ධ උගතකු වන හම්මාද් බින් අබූසුලයිම්ගේ පන්තියට බැඳී නිපුණතාව ලදහ. හජ් ගමන්වල දී මක්කාවේ හා මදීනාවේ ජීවත් වූ විද්වතුන්ගෙන් ද ඉගෙන ගත්තේ ය. සමහර අවස්ථාවල හම්මාද්ගේ පන්තියේ මෙතුමාණෝ ද පන්ති පැවැත්වූහ. හම්මාද්ගේ අභාවයෙන් පසු එම පන්ති දිගට ම මෙතුමා විසින් පවත්වන ලදි.

මෙම කාලවකවානුවේ දී ෆික්හ් ප්‍රශ්න ඇති වූ විට ඉමාම් අබූ හනීෆා තුමාණෝ තමා පෞද්ගලික ව ද සමකාලීන උගතුන් සමඟ එකතු වී ද විසඳුම් ලබා දුන්හ. ඒවා ග්‍රන්ථාරූඪ කරනු ලැබ පසු කාලයේ ෆික්හුල් අක්බර් යන නමින් ප්‍රසිද්ධ විය.

මෙතුමන්ගේ කාලයේ හදීස්හි සත්‍යභාවය සනාථ නොවූ නිසා තමා නිවැරදි යැයි හඳුනා ගත් හදීස් පදනම් කරගෙන ඉජ්තිහාද් මඟින් විසඳුම් ලබා දුන්හ. මේ නිසා මෙතුමන්ගේ චින්තන විප්ලවය "මද්රසතුර් රහ්යු" නම් වේ. මෙතුමන්ගේ ශිෂ්‍යයන් වශයෙන් ඉමාම් අබූ යූසුෆ්, සුෆර්, හසන්, ෂයිබානී ආදීන් තම ගුරුතුමාගේ අදහස් පසුකාලයේ හදීස් සමඟ එක් කොට ඔප් නැංවූහ.

මෙතුමන්ගේ මද්හබය "හනෆි මද්හබය" යැයි හැඳින්විණි. කලීෆා හාරූන් කාලයේ අගවිනිසුරුවරයා ලෙස සේවය කළ නිසා, ඒකල හනෆි මද්හබය රාජ්‍ය මද්හබය ලෙස ප්‍රකාශයට පත් විය.

ඉමාම් මාලික් රහිමහුල්ලාහ් (හිජ්රි 93-179)

මාලික් ඉබ්නු අනස් යන මුල් නමින් යුක්ත වූ එතුමාණෝ මදීනාවේ ඉපදුණහ. ඒ නිසා"ඉමාමුල් මදීනා" (මදීනාවේ ඉමාම්) යැයි හැඳුන්වනු ලැබූහ. ඉමාම් අබූ හනීෆා රහිමහුල්ලාහ් තුමාගේ සමකාලීනයකු වූ එතුමා මදීනාවේ ජීවත් වූ තාබිඊ උගතුන්ගෙන් හදීසය හා ෆික්හය උගත්තේ ය. මෙතුමා මදීනාවේ දේශන පැවැත්වූ අතර එයට එතුමන්ගේ ශිෂ්‍යයෝ මෙන් ම මහජනයා ද සහභාගී වූහ. සමහර අවස්ථාවල කලීෆාවරු ද මීට සහභාගී වූහ.

ඉමාම් මාලික් තුමා මදීනාවේ ජීවත් වූ නිසා හදීස් ලබා ගැනීම එතුමාට පහසුවක් විය. එනිසා ෆික්හු ප්‍රශ්නවලට අදාළ විසඳුම්වලට තීන්දුව අල් කුර්ආන් හා සුන්නාහ් පදනමින් ඉදිරිපත් කළේ ය. එතුමන්ගේ ෆික්හ් චින්තනය "මද්රසතුල් අසර් "නම් විය. මෙතුමන්ගේ මද්හබය මාලිකී යැයි හැඳින්විණි.

මෙතුමාගේ ග්‍රන්ථ අතර මුවත්තා සුප්‍රසිද්ධ ය. මෙතුමාගේ ශිෂ්‍ය යහ්යා අන්දුලූසි යන අය විසින් ස්පාඤ්ඤයේ මාලිකි මද්හබය හඳුන්වාදෙනු ලැබූ අතර කලීෆා දෙවන හකම්ගේ කලයේ දී එහි රාජ්‍ය මද්හබය වශයෙන් ද ප්‍රකාශයට පත් කරන ලදි.

මාලකී මද්හබය මදීනාවේ හඳුන්වනු ලැබුව ද එය උතුරු හා බටහිර දකුණු අප්‍රිකානු රටවල සැළකිය යුතු තරම් බලපෑමක් ඇති කර ඇත.

ඉමාම් ෂාෆිඊ රහිමහුල්ලාහ් (හිජ්රි 150-204)

මුහම්මද් ඉබ්නු ඉද්රීස් යන්න මෙතුමාගේ මුල් නම වන්නේ ය. මෙතුමා පලස්තීනයේ ගාසාහි උපත ලැබුවේ ය. කුරෛෂි වංශයට අයත් මෙතුමාණෝ "ආලිමුල් කුරෛෂ්" යන අන්‍ය නාමයකින් ද හඳුන්වනු ලැබූහ.

මක්කාවේ හා මදීනාවේ අධ්‍යාපනය ලද එතුමාණෝ ඉස්ලාමීය අධිරාජ්‍යයේ අගනුවර වූ බැග්ඩෑඩ් හි ඉගැන්වීම් කටයුතුවල යෙදුණහ. ටික කලක් යේමන්හි රාජ්‍ය පාලන කටයුතුවලට ද සහභාගී වූ බැග්ඩෑඩ් හි මුෆ්ති ලෙස ද දේශකයා ලෙස ද සේවය කළේ ය. බැග්ඩෑඩයේ මුඃතසිලාවරුන්ගේ බලපෑම වැඩි වූ නිසා එහි සිට ඊජිප්තුවට ගියේ ය.

සුන්නාවෙහි හා ෆික්හ්හි දක්ෂ ඉමාම් ෂාෆිඊ රහ්මහුල්ලාහ් සම කාලීන අරාබි සාහිත්‍ය, වෛද්‍ය විද්‍යාව වැනි ක්ෂේත්‍රවල ද ප්‍රවීණයෙක් වූයේ ය. තව ද ඔහු කවියෙකු ලෙස ද ප්‍රසිද්ධ ය. මුස්නද් ඉමාම් ෂාෆිඊ, කිතාබ් අල් උම්මු, අර්රිසාලතුල් උසූලියියා ආදිය එතුමාගේ ග්‍රන්ථ වශයෙන් සුප්‍රසිද්ධ ය.

ඉමාම් ෂාෆිඊ රහ්මහුල්ලාහ් තුමා, ඉමාම් මාලික් හා හනෆි මද්හබයට අයත් ඉමාම් අබූයූසුෆ්ගෙන් අධ්‍යාපනය ලබා ගත්තේ ය. මෙයින් එතුමන්ගේ චින්තන ක්‍රමය මද්රසතුල් අසර්, මද්රසතුල් රහ්යු යන අංශ දෙක අන්තර්ගත වූ නිසා වඩා නව්‍යතාවක් සහිත ය.

මෙතුමා බග්දාදයේ ජීවත් වූ කාලයේ ලබා දුන් විසඳුම් "කදීම්" යැයි ද ඊජිප්තුවේ ලබා දුන් තීන්දු "ජදීද් " යැයි ද හැඳින්වේ. මෙතුමන්ගේ මද්හබය සුල්තාන් සලාහුදී-න් කාලයේ ඊජිප්තුවේ රාජ්‍ය මද්හබය ලෙස ප්‍රකාශයට පත් විය. ඒනිසා එම මද්හබය වර්ධනය වීමට සුදුසු වාතවරණය උද විය. ශ්‍රී ලංකාව, ඉන්දුනීසියාව, මැලේසියාව, ඊජිප්තුව වැනි රටවල බහුතරයක් ෂාෆිඊ මද්හබයට අයත් ය.

ඉමාම් හම්බලි රහිමහුල්ලාහ් (හිජ්රි 161-241)

අහ්මද් ඉබ්නු මුහම්මද් හම්බල් යනු මෙතුමාගේ මුල් නම වේ. මෙතුමා බැග්ඩෑඩයේ ඉපදී හැදී වැඩුණේ ය. ඉමාම් ෂාෆිඊ, ඉමාම් අබූයූසුෆ්ගේ ශිෂ්‍යයෙකු වූ නිසා ද බැග්ඩෑඩයේ ජීවත් වූ නිසා ද විවිධ ක්ෂේත්‍රවල කුසලතා ලබා ගැනීමේ අවස්ථාව උද විය.

මෙතුමා හදීස් ෆික්හ් යන ක්ෂේත්‍ර දෙකෙහි ම සේවය කර ඇත. මෙතුමාගේ ග්‍රන්ථ අතර "මුස්නද් අහ්මද්" සුප්‍රසිද්ධ ය. ග්‍රීක චින්තනාභාෂයෙන් බිහි වූ මූඃතසිලාවරුන්ගේ අදහස් පැතිර පැවතුණු එම කාලයේ එතුමා අල් කුර්ආන් හා සුන්නා පදනමින් තම අදහස් ඉදිරිපත් කළේ ය. එනිසා එතුමන්ගේ චින්තනය "මද්රසතුල් අසර්" විය. අබ්බාසිය කලීෆා මුතවක්කිල් කාලයේ හන්බලි මද්හබය රාජ්‍ය මද්හබය ලෙස ප්‍රකාශ කෙරුණි.

සවුදි අරාබි රාජ්‍ය අනුමැතිය ලද මද්හබය වන නිසා මෙය අරාබි අර්ධද්වීපයේ බලවත් මද්හබය ලෙස පවතී. මෙ හතර දෙනාට අමතර ව වෙනත් විද්වතුන් ද ෆික්හි ක්ෂේත්‍රයට මහත් සේවයක් සලසා ඇත්තාහ. ඔවුන්ගේ ෆික්හ් චින්තනය ජනතාව අතර පුළුල් අනුමැතිය ලබා නැති අතර නීති ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේ දී ඔවුන්ගේ අදහස් සැලකිල්ලට ගනු ලබන්නේ ය.

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

❁ الْفِقْهُ ❁ التَّفْسِيرُ ❁ المَعْرُوفَاتُ ❁ المُنْكَرَاتُ ❁ مَسْأَلَةٌ فِقْهِيَّةٌ ❁ مَذْهَبٌ
❁ الإِجْمَاعُ ❁ القِيَاسُ ❁ مَدْرَسَةُ الأَثَرِ ❁ مَدْرَسَةُ الرَّأيِ

අභ්‍යාසය

(අ) වරහන් තුළ ඇති වඩාත් නිවැරදි වචනය සළකුණු කරන්න.

1.ඉජ්තිහාද් මගින් ලැබූ කලාව (හදීස්, ෆික්හ්, තෆ්සීර්, තජ්වීද්)
2.ඉමාම් ෂාෆීර් තුමා උපන් ස්ථානය (බැග්ඩෑඩ්, කුෆා, මදීනා, ගාසා)
3.ඉමාම් අබූ හනීෆා උපන් වසර (හි 80, හි 93, හි 150, හි 204)
4.ඉමාමුල් අහ්ලම් යනු ඉමාම්වරයා (ඉමාම් ෂාෆීර්, ඉමාම් හනෆි, ඉමාම් හම්බලි, ඉමාම් මාලිකි)
5.ඉමාම් හන්බලිගේ ප්‍රධාන ගුරුවරයා (හම්මාද්, මාලික්, ෂාෆිර්, අබූ හනීෆා)
6.පලස්තීනයේ ඉපිද ඊජිප්තුවේ අභාවයට පත් ඉමාම් වරයාගේ මුල් නම (අහ්මද්, මුහම්මද්, නුඃමාන්, මාලික්)
7.ෂාෆිර් මද්හබයේ රාජ්‍ය මද්හබය ලෙස ප්‍රසිද්ධියට පත් කළ පාලකයා (සුල්තාන් සලාහුදීන්, කලීෆා මුතවක්කිල් , කලීෆා හාරූන්)
8.ඉමාම් ෂාෆීර් තුමා ගොනු කළ ෆික්හ් ග්‍රන්ථය (මුවත්තා, උම්මු, ෆික්හුල්, අක්බර්, මුස්නද් අහමද්)

(ආ) පහත වචන අතර වෙනස පැහැදිලි කරන්න.
මද්රසතුල් අසර්, මද්රසතුල් රඃය්යු
මුජ්තහිද් මුකල්ලිද්

ඉ) ෆික්හ් කලාව බිහි වී වර්ධන වූ ක්‍රමය කෙටියෙන් ගෙන හැර දක්වන්න